00040

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPD4535/ESD2235 -** පෞරුෂ මනෝවිද්‍යාව

කාලය - පැය තුනයි. (03)

| දිනය - 2023.07.15 | වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා |
|---|---|

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'පෞරුෂය' යන්න පැහැදිලි කරන්න.

02. පෞරුෂ ගති ලක්ෂණ දහයක් (10) ලියන්න.

03. සිග්මන් ෆ්‍රොයිඩ් විසින් දක්වන ලද පෞරුෂයේ ප්‍රධාන සංරචක පැහැදිලි කරන්න.

04. ඕල්පෝට් (1966) හඳුන්වා දෙන ලද මූලික ගති ලක්ෂණ කාණ්ඩ කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ළමයින්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක (02) පැහැදිලි කරන්න.

06. පුද්ගල විවිධත්වය යන්න උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. ප්‍රතිවිරෝධී චර්යා අක්‍රමතාවයෙන් යුතු ළමුන්ගෙන් ප්‍රදර්ශනය වන ලක්ෂණ පහක් (05) ලියන්න.

08. දරුවන් තුළ සමබර පෞරුෂයක් සංවර්ධනය සඳහා දෙමාපියන් කළයුතු ක්‍රියාවලින් පහක් (05) ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) අන්තර්වර්තික හා බහිර්වර්තික පෞරුෂ ගති ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) බහිර්වර්තික පෞරුෂ ගති ලක්ෂණ වර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරුන්ට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) සිසුන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා පෙරපාසල් ගුරුවරියක වශයෙන් සංවිධානය කළහැකි වැඩ සටහන් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) එවැනි වැඩසටහන් සංවිධානය කිරීමේ දී පෙරපාසල් ගුරුවරයෙකුට මුහුණදීමට වන ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) පෞරුෂය පිළිබඳ සමාජ ඉගෙනුම් න්‍යායවාදීන්ගේ හා චර්යාවාදීන්ගේ අදහස් විමර්ශනය කරන්න. (ලකුණු 10)

(ii) පෞරුෂය පිළිබඳ සමාජ ඉගෙනුම් න්‍යායට අනුව දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා පෙරපාසල් ගුරුවරියක උපායමාර්ග භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) කාංසාමය අක්‍රමතාව හඳුන්වන්න. (ලකුණු 03)

(ii) කාංසාමය අක්‍රමතාවට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) කාංසාමය අක්‍රමතාවයෙන් මිදීමට ගුරුවරයෙකු වශයෙන් දරුවාට උපකාර විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) චර්යාත්මක ගැටලු සහිත දරුවෙකු නිරීක්ෂණය සඳහා යෝග්‍ය සැලසුමක් සකස් කරන්න. (ලකුණු 08)

(ii) ඔබ සකස්කල නිරීක්ෂණ සැලසුම භාවිත කර දරුවා අධ්‍යයනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) හැසිරීමේ ගැටලු සහිත දරුවෙකුට උපකාර කිරීම සඳහා ගුරුවරයෙකුට කළ හැකි දේ මොනවා ද? (ලකුණු 06)

- හිමිකම් ඇවිරිණි. -